# අධ්‍යාපන අමාත්‍යාංශය
# සහ
# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
# අතර
# අල්ලස හා දූෂණය පිටුදැකීම සඳහා වන ජාතික වැඩසටහන පිළිබඳ
# අවබෝධතා ගිවිසුම

## 1. හැඳින්වීම

<u>අල්ලස හා දූෂණය පිටු දැකීම සඳහා වන ජාතික නිවාරණ වැඩසටහන</u>

2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය පිටු දැකීම සඳහා පාසල් සිසුන්ගේ අල්ලසට හා දූෂණයට එරෙහි වීම පිළිබඳව ඇති දැනුවත් භාවය ඉහල නැංවීමේ අධ්‍යාපනික වැඩසටහනක අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. ඒ සඳහා අල්ලස හා දූෂණය පිටු දැකීම සඳහා වන සුපිළිපන්නභාවය ගොඩ නැංවීම අරමුණු කොටගත් වැඩසටහන් සඳහා උපරිම දායකත්වය ලබා ගැනීම සහ කුඩා කළ සිටම පාසල් සිසුන්ගේ යහපත් ආකල්ප වර්ධනය කිරීමේ අභිලාෂයෙන් 2022 ඔක්තොම්බර් 01 වන දිනට යෙදෙන ලෝක ළමා දිනය කේන්ද්‍ර කරගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අතර 2022 ඔක්තොම්බර් 01 වන දින දී ඇති කර ගනු ලබන අවබෝධතා ගිවිසුම පහත පරිදි වේ. මෙම ගිවිසුම 2030 වර්ෂය අවසානය දක්වා බලාත්මක වනු ඇත.

## 2. අරමුණු

2.1. අල්ලස හා දූෂණය පිටු දැකීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ යෝජිත දෙවන උපාය මාර්ගය වන සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනය හා ප්‍රජා සහභාගිත්ව ප්‍රවේශය තුළින් ශ්‍රී ලංකාව තුළ සුපිළිපන් අධ්‍යාපන ප්‍රවේශයක් ලබා දීම.

2.2. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව හා ජාතික අධ්‍යාපන ආයතන සමඟ එක්ව අධ්‍යාපන ක්ෂේත්‍රයේ මාණ්ඩලික නිලධාරීන්, ගුරුවරුන්, අනධ්‍යයන නිලධාරීන්, ගුරු ශිෂ්‍යයන් සහ සියු දරුවන් ඉලක්ක කොට ගෙන සුපිළිපන්න පණිවිඩය සමාජගත කිරීම , දැනුම්වත් කිරීම , බලගැන්වීම හා ඔවුන් ඇසුරේ සුපිළිපන්න සිසු පරපුරක් බිහිකිරීම.

2.3. අල්ලස හා දූෂණයෙන් තොර සමාජයක් බිහි කරලීම සඳහා කුඩා කල සිටම දරුවා තුල යහපත් ආකල්ප වර්ධනය කිරීම මඟින් අනාගත සමාජය තුළ අල්ලස් හෝ දූෂණයට ඇති ඉඩ ප්‍රස්ථා අවම කරලීම හා අධ්‍යාපන පද්ධතිය තුළ මෙන්ම ඉන් පිටත දූෂණ විරෝධී සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම.

2.4. ක්‍රියාකාරිත්වය තුළින් සුපිරිසිදු සමාජ පද්ධතියක් ගොඩ නැංවීමට පාසල් සිසුන් මඟින් පාසල් ප්‍රජාව දැනුවත් කිරීම, අල්ලස හා දූෂණයට එරෙහි වීම පිණිස නායකත්වය දිය හැකි හා ක්‍රියාත්මක විය හැකි සිසු පරපුරක් බිහි කිරීම.

2.5. අන්‍යෝන්‍ය ගරුත්වය, අල්පේච්ඡතාවය, ස්වයං විනය වැනි ධනාත්මක සාරධර්ම ස්ථාපනය කිරීම තුළින් රටේ සම්පත් ආරක්ෂාව හා අභිමානවත් පුරවැසියෙකු ලෙස ජීවත් වීමේ වටිනාකම සිසු දරුවන් හට අවබෝධ කරවීම.

2.6. සාරධර්ම මත පදනම් වූ අධ්‍යාපනය හා ප්‍රජා මැදිහත්වීම තුළින් සුපිළිපන්න ආකල්පය පාසල් ප්‍රජාව තුළ වර්ධනය කිරීම හා සමාජයේ පවතින අල්ලස් හා දූෂණ ක්‍රියාවලට පාසල් සිසුන් විරුද්ධ වීම තුළින් සමාජය වෙත යහපත් පණිවිඩයක් ගෙනයාම.

මෙම අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා අල්ලස හා දූෂණය මඟින් ඇතිවන සමාජීය, ආර්ථික හා මානසික හා පුද්ගලමය බලපෑම පිළිබඳව පාසල් සිසුන්ට, ගුරුභවතුන්ට, දෙමාපියන්ට හා විදුහල්පතිවරුන්ට, අධ්‍යාපන ක්ෂේත්‍රයේ අනෙකුත් නිලධාරීන්ට හා දෙමාපියන්ට විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ අවබෝධ කරදීම මඟින් සමාජයේ පවතින අල්ලස හා දූෂණය අවම කිරීමට හා තුරන් කිරීමට අපේක්ෂිතය. මේ සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් අධ්‍යාපන අමාත්‍යාංශය හා එකාබද්ධව ක්‍රියාත්මක කිරීමට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කටයුතු කරනු ඇත.

## 3. ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් (2022-2030)

3.1. අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය සමගාමී අංශය, ගුරු විද්‍යා පීඨ, ගුරු අභ්‍යාස විද්‍යාල, විදුහල්පතිවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, ශිෂ්‍ය නායකයන්, ශිෂ්‍ය සංගම්, දෙමාපියන් ආදී අංශ යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් හා බලගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3.2. මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, කලාප අධ්‍යාපන කාර්යාලයන්හි සේවයේ නියුතු නිලධාරීන් උදෙසා සුපිළිපන්න සමාජ ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3.3. අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන ආයතනය සමඟ සාකච්ඡා කොට අල්ලස හා දූෂණයේ ප්‍රතිවිපාක පිළිබඳ පාසල් විෂය නිර්දේශයට ඇතුලත් කිරීම.

3.4. ප්‍රාථමික, ද්විතීක හා උසස් පාසල්වල විෂය මාලාවට සුපිළිපන්නතාවය හා දූෂණ විරෝධී සංකල්පය හඳුන්වා දීම. (පුරවැසි අධ්‍යාපනය විෂය ධාරාව තුළට මෙම සුපිළිපන්නතාවය පිළිබඳ මොඩියුලය ඇතුලත් කිරීමට අපේක්ෂා කෙරේ)

3.5. දිවයින පුරා සියළු පළාත් ආවරණය වන පරිදි පාසල් තුළ සුපිළිපන්න සමාජ ස්ථාපිත කිරීම සහ බලගැන්වීම පිලිබඳ විදුහල්පතිවරුන් සහ උප විදුහල්පතිවරුන් පුහුණු කිරීම සහ බලගැන්වීම පිලිබඳ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3.6. පාසල් තුළ සුපිළිපන්න සමාජ ස්ථාපිත කිරීම. (චර්යාත්මක වෙනසක් ඇති කිරීමට දේශීය සාහිත්‍ය නිර්මාණයන්, ආගම, ඉතිහාසය යන මාධ්‍ය යොදා ගැනීම)

3.7. ගුරු විද්‍යාලවල ඉගෙනුම ලබන ගුරුවරුන්ට ද, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් බඳවා ගැනීම් සිදු කරමින් පත්වීම් ලබා දෙන ගුරුවරුන්ට ද, දූෂණ විරෝධීබව හා සුපිළිපන්න බව පිලිබඳ ජාතික ප්‍රතිපත්තිය හඳුන්වා දීම සහ දැනුවත්භාවයක් ඇති කිරීම.

3.8. පාසල් තුළ ශිෂ්‍ය නායකයින් ඉලක්ක කොටගෙන අනාගත සුපිළිපන්න නායකයන් බිහිකිරීම උදෙසා දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනයට වැඩමුළු පැවැත්වීම (ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරෙන්)

3.9. අල්ලස සහ දූෂණය වැලැක්වීම උදෙසා සුපිළිපන්න බව පිලිබඳ සිසු දරුවන්ගේ දෙමාපියන් දැනුවත් කිරීමට ද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3.10. අධ්‍යාපන අමාත්‍යාංශය සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි විමර්ශන අංශ අතර ඒකාබද්ධභාවයක් ඇති කිරීම.

3.11. සුපිළිපන්න සමාජ පිලිබඳ චක්‍රලේඛය යාවත්කාලීන කිරීම .

3.12. පළමු වසරට සිසුන් ඇතුලත් කිරීමේ චක්‍රලේඛය හා අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමට අදාල චක්‍රලේඛය යාවත්කාලීන කිරීම සඳහා අල්ලස හා දූෂණයට නිරාවරණය වන අවස්ථා අවම වන අයුරින් නිර්ණායක ඇතුලත් කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සම්පත් දායකත්වය ලබා දීම.

3.13. අල්ලස හෝ දූෂණය සිදු විය හැකි අවස්ථා අවම වන පරිදි පාසල් සංවර්ධන සමිති සහ ආදි ශිෂ්‍ය සංගම් වලට අදාළ චක්‍රලේඛ යාවත්කාලීන කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සම්පත් දායකත්වය ලබා දීම.

3.14. පාසල් සිසුන් හා අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන් දැනුවත් කිරීම සඳහා කථික තරග, විවාද තරග,චිත්‍ර තරග, සාහිත්‍ය තරග, හා දැනුම් මිනුම් තරග විවිධ තාක්ෂණික ක්‍රම යොදාගනිමින් පැවැත්වීම.

3.15. සුපිළිපන්නභාවය පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයක් සිසු දරුවන් හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන් වෙනුවෙන් සංවිධානය හා පැවැත්වීම.

4. අධ්‍යාපන අමාත්‍යාංශයේ දායකත්වය

4.1. පළාත් අධ්‍යාපන ලේකම්වරුන් හා අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ගේ සහයෝගය ඇතිව පාසල් සිසුන්, ගුරුවරුන්, නියෝජ්‍ය විදුහල්පතිවරුන්, විදුහල්පතිවරුන්, මාණ්ඩලික නිලධාරීන් හා අනෙකුත් කාර්ය

මණ්ඩලයන් දැනුවත් කිරීම සඳහා වන වැඩසටහන් සංවිධානය කිරීම හා අනෙකුත් අපේක්ෂිත ක්‍රියාකාරකම් මුදුන් පමුණුවා ගැනීම සඳහා සහයෝගය ලබා දීම.

4.2. අල්ලස හා දූෂණය පිටු දැකීමට හැකිවන පරිදි නිර්ණායක සකස් කිරීම හා ඒවා චක්‍රලේඛ සඳහා ඇතුලත් කිරීම (පළමු වසරට සිසුන් ඇතුලත් කර ගැනීමට අදාළ චක්‍රලේඛ සකස් කිරීම, අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමට අදාළ චක්‍රලේඛ සකස් කිරීම, පාසල් සංවර්ධන සමිති සහ ආදී ශිෂ්‍ය සංගම්වල ක්‍රියාකාරිත්වයට අදාළ චක්‍රලේඛ සකස් කිරීම )

4.3. අධ්‍යාපන අමාත්‍යාංශය සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි විමර්ශන අංශ අතර ඒකාබද්ධතාවයක් ඇති කිරීම සඳහා පහසුකාරකත්වය සැපයීම.

4.4. පාසල්වල විෂය මාලාවට අල්ලස හා දූෂණයේ ප්‍රතිවිපාක, සුපිළිපන්නතාවය හා දූෂණ විරෝධී සංකල්පය හඳුන්වා දීම සඳහා අවශ්‍ය වන නිර්ණායක සකස් කිරීම හා ඒවා විෂය මාලාවට ඇතුලත් කිරීම.

4.5. සුපිළිපන්නභාවය පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයක් (Integrity Symposium) පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම හා අවශ්‍ය දායකත්වය ලබා දීම.

## 5. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දායකත්වය

5.1. අල්ලස හා දූෂණය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අදාළ සම්පත් දායකත්වය සැපයීම.

5.2. චක්‍රලේඛ සංශෝධනයට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහය සහ සම්පත් දායකත්වය ලබා දීම. (පළමු වසරට සිසුන් ඇතුලත් කර ගැනීමට අදාල චක්‍රලේඛ සකස් කිරීම, අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුලත් කර ගැනීමට අදාල චක්‍රලේඛ සකස් කිරීම, පාසල් සංවර්ධන සමිති සහ ආදී ශිෂ්‍ය සංගම්වල ක්‍රියාකාරිත්වයට අදාළ චක්‍රලේඛ සකස් කිරීම )

5.3. පාසල්වල විෂය මාලාවට අල්ලස හා දූෂණයේ ප්‍රතිවිපාක, සුපිළිපන්නතාවය හා දූෂණ විරෝධී සංකල්පය හඳුන්වා දීම සඳහා අවශ්‍ය වන සම්පත් දායකත්වය ලබා දීම.

5.4. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව සංවිධානය කරනු ලබන තරග සහ සුපිළිපන්නභාවය පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණයක් (Integrity Symposium) සඳහා සහතිකපත් මුද්‍රණය කිරීම, ත්‍යාග සම්පාදනය කිරීම හා ජාතික වැඩසටහන සඳහා සම්පූර්ණ අනුග්‍රහය දැක්වීම (ජයග්‍රාහකයින් වෙනුවෙන් ලබාදෙන සහතික සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් අධ්‍යාපන ලේකම් වරයා ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙනුවෙන් එහි අධ්‍යක්ෂ ජනරාල් වරයා ද අත්සන් තබනු ඇත.)

5.5. අධ්‍යාපන අමාත්‍යාංශය සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි විමර්ශන අංශ අතර ඒකාබද්ධතාවයක් ඇති කිරීම සඳහා පහසුකාරකත්වය සැපයීම.

6. මෙම අවබෝධතා ගිවිසුම පාර්ශවයන් අතර එකඟතාවයකින් වෙනස් කල හැකිය.තවද, මෙම අවබෝධතා ගිවිසුමෙහි මුල් පිටපත සිංහල භාෂාවෙන් ලියා අත්සන් කර ඇති අතර වෙනත් භාෂාවකට පරිවර්තනය කර ඇතිවිට අර්ථකථනයේ යම් අපසාරීතාවක් වෙතොත් සිංහල අනුවාදය වලංගු වනු ඇත.

මෙම වැඩසටහන සම්බන්ධීකරණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් අධ්‍යාපන ලේකම් තුමා........................................................ගේ මඟපෙන්වීම යටතේ බලය පවරනු ලබන නිලධාරියෙක්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු ද කටයුතු කරනු ඇත.

මෙම එකඟතා ගිවිසුම දෙපාර්ශවය විසින් 2022 ඔක්තෝම්බර් ......... වන දින කොළඹ දී අත්සන් තබන ලද වගයි.

අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන්

.................................

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

කොමිෂන් සභාව වෙනුවෙන්

.................................

ඩබ්.කේ.ඩී. විජේරත්න
අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

සාක්ෂි

.................................

1. අතිරේක ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

.................................

1. ලේකම්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

.................................

2. අතිරේක ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

.................................

2. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව